ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය - 2022

-----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ “ මණ්ඩලය’’ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දේපළ පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 වන ඡේදයට අනුව, වත්කම් වල ප්‍රයෝජනවත් ආයුකාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකදීම සමාලෝචනය කරනු ලැබිය යුතු අතර ඵලදායී ජීව කාලය කලින් ඇස්තමේන්තු වලට වඩා වෙනස්නම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 අනුව ගිණුම්ගත කළ යුතු නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති දැනට භාවිතයේ පවතින පිරිවැය රු.470,023,622 ක් වූ දේපළ පිරියත හා උපකරණ වල ප්‍රයෝජනවත් ජීවන කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම්ගත කර නොතිබුණි. | මණ්ඩලය සතු වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම පිළිබඳ 2024 වර්ෂයේ පටන් කටයුතු කරනු ඇත. | ප්‍රමිතියේ ප්‍රතිපාදන ප්‍රකාරව වත්කම්වල ප්‍රයොජනවත් ජීවිතකාලය සමාලෝචනය කර අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතුය. |
| (ආ) 2016 වර්ෂයට පෙර සිට පැවත එන ප්‍රාග්ධන ප්‍රදාන යටතේ දක්වා ඇති රු.10,500,000 ක් වටිනා Cess Fund නම් ප්‍රදානය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20 හි 26 හෝ 27 ඡේද පරිදි ක්‍රමක්ෂය කර නොතිබුණි. | මෙම ප්‍රදානය ක්‍රමක්ෂය කිරීම 2024 වර්ෂයේ පටන් ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ඇත. | ප්‍රමිතියේ ප්‍රතිපාදන ප්‍රකාරව ක්‍රමක්ෂය ගැලපීම් සිදු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව ජනපද ණයගැති ශේෂය රු.22,192,934 ක් වූ අතර ඒ තුළ රු.2,582,297 ක හඳුනා නොගත් පොදු ශේෂයක් පැවතිණි. | 2023 වර්ෂයේ ගිණුම් සැකසීමේදී එම වෙනස හඳුනා ගත් අතර අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කොට ඇත. | ශේෂයන් හඳුනාගෙන නිවැරදිව ගැලපීම් කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| (අ)ගම්මාන සංවර්ධන වැඩසටහන | 2,722,356 | - | 2,722,356 | අවශ්‍ය ගිණුම්කරණ ප්‍රතිකර්ම සිදු කිරීම මේ වන විට ආරම්භ කර ඇත. | මූල්‍ය ප්‍රකාශන වටිනාකම් හා අනුරූපී වාර්තාවල වටිනාකම් නිවැරදිව ගැලපීම කළ යුතුය. |
| (ආ)නංවමු ලංකා වැඩසටහන | 5,117,669 | - | 5,117,669 | අවශ්‍ය ගිණුම්කරණ ප්‍රතිකර්ම සිදු කිරීම මේ වන විට ආරම්භ කර ඇත. | - එම - |
| (ඇ)ජනපද හිඟකුලී ආදායම | 22,192,934 | 19,091,044 | 3,101,890 | මෙම එකිනෙක ශේෂ සෑදී ඇති ආකාරය පිළිබඳව සොයා බලා සැසඳීම් කොට නිවැරදි කිරීම් 2024 වර්ෂය තුළදී කරනු ඇත. | - එම - |
| (ඈ)ජනපද ජල ගාස්තු ආදායම | 7,715,837 | 7,191,834 | 524,002 | එම වැරදි හඳුනාගෙන නිවැරදි කිරීම් සිදු කොට ඇත. | - එම - |
| (ඉ)පරීක්ෂක ආදායම | 683,115 | 1,348,406 | 665,291 | 2023 වර්ෂයේදී නිවැරදි කර ඇත. | - එම - |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අබලි පෙර ගෙවුම් ශේෂය තුල 2021 වර්ෂය හා ඊට පෙර වර්ෂයන්ට ආදාලව නිරවුල් වී නොමැති රු.6,050,081ක ශේෂයක් පැවතිණි. | 2021 හා 2022 වර්ෂයන්ට අදාළ අබලි පෙර ගෙවුම් වලට අදාළ තවදුරටත් පියවීමට පවතින ශේෂයන් ඇත. | අදාල භාණ්ඩ ලබා ගැනීමට හෝ මුදල් ලබා ගැනීමට හෝ කටයුතු කළ යුතුය. |
| (ආ) වෙනත් ජංගම වත්කම්හි 2020 වර්ෂයේ සිට නිරවුල් නොවී පවතින රු. 7,357,288 ක ශේෂයන් 07ක් පැවති අතර මේවා නිරවුල් කර ගැනීමට මණ්ඩලය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | ශේෂයන් පියවීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන ඇත. | ලැබිය යුතු ශේෂයන් නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වෙළඳ ණයහිමියෝ ශේෂ 33ක වටිනාකම රු.12,238,482 ක් හා වෙනත් ණයහිමියෝ ශේෂ 13ක වටිනාකම රු.9,587,167 ක් වර්ෂ 2 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් විය. | මෙම ශේෂයන් මේ වන විට නිරවුල් කර ඇත. | ශේෂයන් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | 2011 දෙසැම්බර් 12 දිනැති අංක 28/2011 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 2012 ජනවාරි මස 01 දින සිට ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට අයත් නිලධාරීන් සඳහා මාසිකව රු.15,000ක දීමනාවක් ගෙවීමට අනුමැතිය ලබා දී තිබූ අතර මෙම චක්‍රලේඛයෙන් දීමනා ගෙවීමට අනුමත කර නොමැති ආයතන සඳහා දීමනා ගෙවන්නේ නම් අමාත්‍යාංශ ලේකම් හරහා | රු.15,000 ක ඉංජිනේරු දීමනාවක් ගෙවීම් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල නිර්දේශය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබී ඇත. එම අනුමැතිය අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ඔවුන්ගේ අනුමැතිය අනුව | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාගත යුතු වුවත් කාර්මික සංවර්ධන මණ්ඩලය එවන් අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත නිලධාරීන් 12 ක් සඳහා 2018වර්ෂයේ සිට සේවා කාලය පදනම් කර නොගෙන සම්පූර්ණ දීමනාව ගෙවීම හේතුවෙන් අනුමත දීමනාව ඉක්මවා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු 6,177,000.ක් වැඩිපුර ගෙවා තිබුණි . | අදාළ දීමනාව මණ්ඩලයේ ඉංජිනේරුවන් වෙත ගෙවා ඇත. | |
| (ආ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය | සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් ගිණුම් වර්ෂය අවසන් වී දින හැටක් (60) ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2023 නොවැම්බර් 02 දින එනම් මාස 08 ක ප්‍රමාදයකින් පසු විගණනයට ඉදිරිපත් කරන ලදී. | ඉදිරියේදී නිවැරදි වනු ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 103,616,824 ක ලාභයක්වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 59,318,302 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.44,298,522 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ඉකුත් වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේදී විකුණුම් පිරිවැය රු.40,683,991කින් හා පරිපාලන වියදම් රු.68,914,484 කින් වැඩි වුවද ඊට සාපේක්ෂව රජයේ පුනරාවර්තන ප්‍රදානයන් රු.39,650,000 කින්, මුළු ආදායම රු.101,807,704 කින් හා බැංකු පොලී ආදායම රු.9,142,997 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වෙළඳ හා වෙනත් ණයහිමි ශේෂය තුළ ණයගැතියන්ගෙන් කලින් ලැබීම් ලෙස රු.52,628,070 ක් දක්වා තිබුණු අතර පද්ධතිය නිවැරදිව යාවත්කාලීන නොකිරීම හේතුවෙන් මෙම ශේෂය ජනිත වී ඇති බව අනාවරණය විය. | අදාළ තොරතුරු සියල්ල යාවත්කාලීන කරන ලදී. | පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) විමලසුරේන්ද්‍ර විදුලි බලාගාරයෙන් ඉවත් කරන ලද මහනුවර දිස්ත්‍රික් කාර්යාලය මඟින් 2022 වර්ෂයේ දී මිලදී ගෙන තිබූ අබලි තඹවලින් රු. 3,754,298ක වටිනාකමැති ලෝහ මණ්ඩලය වෙත ලැබී නොතිබුණි. තවද, එම මුදල් ආපසු ලබා ගැනීමට හෝ භාණ්ඩ ලබාගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | අදාළ වටිනාකම ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත පියවන ලෙස ඔවුන් වෙත ලිඛිතව දන්වා ඇත. | හිඟ මුදල ලබා ගැනීමට හෝ භාණ්ඩ ලබාගැනීමට ආයතනය කටයුතු කළ යුතුය. |
| (ඇ) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට අයත් මාතර වැඩහල වෙත ජාතික ශිල්ප සභාව විසින් රු.3,850,740ක වටිනාකමැති යන්ත්‍ර 3ක් සකස් කිරීමට 2021 වර්ෂයේ දී ලබා දී තිබුණ ද, 2023 මාර්තු මස විගණනය විසින් සිදුකල ස්ථානීය පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූයේ මා වේවැල් කැලයෙන් ඇදීම සඳහා වන රු.351,000 ක් වටිනා යන්ත්‍රය හැර අනෙකුත් යන්ත්‍ර 2 හි වැඩ අවසන්කර නොතිබුණු බවයි. 2024 ජනවාරි අවසන් වනවිටත් මෙම යන්ත්‍ර තුනෙහි වැඩ නිමකර ශිල්ප සභාවට භාර දී නොතිබුණි. | එම යන්ත්‍ර නිමකර හැකි ඉක්මනින් ලබා දීමට අවශ්‍ය කටයුතු කරනු ඇත. | භාරගත් වැඩ ඇණවුම් නිසිකලට ඉටුකිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්මික සංවර්ධන මණ්ඩලය සතු කාර්මික ජනපද 16 හි බිම් කොටස් 733ක් පවතින අතර ඉන් බිම් කොටස් 52ක් කර්මාන්තකරුවන්ට බෙදා දී නොතිබීමෙන් වර්ෂ කිහිපයක සිට භාවිතයෙන් තොරව පැවතුණි. තවද | මණ්ඩලයට අයත් ප්‍රධාන කාර්මික ජනපද වන ඒකල, පල්ලෙකැලේ, හොරණ, පන්නල, පානළුව යන ජනපදවල හිස් බිම් කොටස් නොපවතී. 2019 වසරේ අදියර අදියර 02 සංවර්ධන කටයුතු | බිම් කොටස් කර්මාන්තකරුවන්ට බෙදා දීමට හා ඵලදායී කර්මාන්ත නගා සිටුවීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| කාර්මික ජනපද 05ක ඉඩම් කට්ටි 23ක් පුද්ගලික පදිංචිය සඳහා භාවිතයට ගෙන තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට ජනපදයන්හි කර්මාන්ත ශාලා 29ක් ක්‍රියාත්මක නොවී වසා දමා තිබූ අතර ඒවා වෙනත් කර්මාන්තකරුවන්ට බෙදා දීමට කටයුතු කර නොතිබුණි. | ආරම්භ කරන ලද නැගම්පහ හා අච්චුවේලි කාර්මික ජනපදවල පවතින හිස් බිම් කොටස් ප්‍රමාණය 30 කි. කොටගල හා මිහින්තලේ ජනපදවල පවතින හිස්බිම් කොටස් ප්‍රමාණය 11 කි. මෙම බිම් කොටස් නව ආයෝජකයන් වෙත පවරාදීම සඳහා අවශ්‍ය ප්‍රචාරණ කටයුතු සිදු කෙරෙමින් පවතී. | |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉංජිනේරු අංශයේ වැඩහළෙහි, 2022 දෙසැම්බර් 31 දිනට වසර 11කට වඩා පැරණි පාවිච්චි කළ නොහැකි යන්ත්‍ර හා අනෙකුත් උපකරණ 34ක් පැවතියද මෙම අයිතමයන් අංශයෙන් ඉවත් කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම විශාල සිදුරු කුඩා කිරීම, කුඩා සිදුරු විශාල කිරීම, ලෝහ කැබලි කැපීම යනාදී බාහිර කාර්යයන් සඳහා ඉල්ලුමක් පවතින Boring Machine, Electrical Discharging Machine, Die Sinking Machine සහ Power Hammer for Black Smithy Work යන යන්ත්‍ර 04 හි ක්‍රියාකරුවන් නොමැති වීම මත වසර 11කට වැඩි කාලයක සිට නිශ්කාර්යව පැවතිණි. | කර්මාන්තශාලාවේ ඇති භාවිතයට නොගන්නා වසර 11 කට වඩා පැරණි යන්ත්‍ර හා කොටස් වෙන් කර ලොට් කර ඇති අතර එම ලොට් වල මිල ගණන් තීරණය කර වෙන්දේසි කිරීමට ඉතා ඉක්මනින් කටයුතු කරනු ඇත. වැඩහලේ පවතින Boring machine, Electrical discharging machine වල දෝෂයක් ඇති අතර ඒ සඳහා සුදුසු පුහුණු ශ්‍රමිකයන් හිඟයක් පවතී. තවද එම යන්ත්‍ර අළුත්වැඩියා කටයුතු කිරීමට විශාල වියදමක් දැරීමට සිදුවන බැවින් පුහුණු සේවකයින් යෙදවීමට එතරම් ආර්ථික වශයෙන් වාසි නොමැත. | පාවිච්චි කළ නොහැකි හා නිෂ්ක්‍රීය උපකරණ ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) පැලියගොඩ රබර් සංවර්ධන හා සේවා මධ්‍යස්ථානයට රබර් ආශ්‍රිත නිෂ්පාදන වල ගුණත්වය වැඩි දියුණු කිරීම, නාස්තිය අවම කිරීම, නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම හා නිෂ්පාදන පිරිවැය අවම කිරීම, සුළු හා මධ්‍යම මට්ටමේ කර්මාන්ත වලට භාවිතය හඳුන්වා දීම හා දිරිගැන්වීම ආදිය අරමුණු පෙරදැරිව රබර් ඉන්ජෙක්ෂන් මෝල්ඩිං යන්ත්‍රයක් 2016 වර්ෂයේදී රු.9,318,026 ක මුදලකට මිලදී ගෙන තිබුණි. මිලදී ගත් දින සිට පුහුණු ලාභීන් 328 දෙනෙකුට පමණක් පුහුණුව ලබා දී තිබූ අතර, | රබර් භාණ්ඩ සංවර්ධන අංශයේ සවිකර තිබූ ඉංජෙක්ෂන් මෝල්ඩින් යන්ත්‍රය මේ වන විට ප්‍රධාන කාර්යාලයේ ඉංජිනේරු අංශය වෙත රැගෙන ගොස් ඇත. එය අළුත් වැඩියා කර ඉදිරියේදී මෝටර් රථ වාහන අමතර කොටස් නිෂ්පාදනය සඳහා යොදා ගැනීමට නියමිතය. | යන්ත්‍රය ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| 2020 වර්ෂයේ සිට 2023 විගණිත දින වන විටත් මෙම යන්ත්‍රය අක්‍රීය තත්ත්වයෙන් මණ්ඩලයේ ඉංජිනේරු වැඩහල භූමියේ රඳවා තිබුණි. | | |
| (ඇ)2016 අගෝස්තු 17 දින අමප/16/1424/723/039 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් රජයේ දායකත්වයක් සහිතව රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානයක් පිහිටුවීමට අනුමැතිය ලබා දී තිබුණු අතර ඒ සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ නවබිම පෙර වැඩුම් මධ්‍යස්ථානය තෝරාගෙන තිබුණි. නවබිම ගොඩනැගිල්ලක කාමර 5කින් යුත් පහල හා දෙවන මහල ඉදිකිරීම, අළුත්වැඩියා හා නවීකරණය කිරීම සඳහා රු.මිලියන 40 ක් පමණ දරා තිබුණි. එසේම මෙම ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් රු.මිලියන 35 ක් පමණ වටිනා රොබෝ තාක්ෂණික යන්ත්‍රෝපකරණ 2018 හා 2019 වර්ෂයන්හිදී මෙම මධ්‍යස්ථානයේ ස්ථාපිත කර තිබුණි. මෙය ක්‍රියාත්මක කිරීම සඳහා බඳවා ගත් විධායක නිලධාරියාට 2017 සැප්තැම්බර් සිට 2018 ඔක්තෝබර් දක්වා මසකට රු.725,000 බැගින් වැටුප් හා දීමනා ලෙස එකතුව රු.මිලියන 11 ක් පමණ ගෙවා තිබුණද අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා එහි කටයුතු ආරම්භ කිරීම කර නොතිබුණි. මෙහි අසාර්ථකත්වය මත කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පැවති මෙම මධ්‍යස්ථානය 2023 වර්ෂය වන විට තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පැවතියද, 2023 ඔක්තෝබර් මස සිදු කල ක්ෂේත්‍ර පරීක්ෂාවට අනුව මෙහි ස්ථාපිත කර ඇති වායුසමීකරණ යන්ත්‍ර 15 ක් හා වර්ග අඩි 7200 ක පමණ වූ භූමි ප්‍රමාණය මෙන්ම ස්ථාපිත කර ඇති යන්ත්‍රෝපකරණ නිශ්කාර්යව වර්ෂ 06 කට අධික කාලයක සිට පැවතිණි. කෙසේ වුවද ලංකාවේ කර්මාන්ත වලට ධෛර්යය දීම, ඒවා වැඩි දියුණු කිරීම හා සංවර්ධනයට සහාය වීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණ ද මෙතෙක් එය ඉටු වී නොතිබුණි. | රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය අප විසින් ඉතා සුදුසු පරිදි ස්ථාපිත කිරීමට උත්සාහ කලද මෙම මධ්‍යස්ථානය විවිධ අමාත්‍යාංශ යටතේ පැවති අතර දැනට මෙම මධ්‍යස්ථානයේ හිමිකාරිත්වය මණ්ඩලය සතුව නොමැත.<br>නමුත් මෙම රොබෝ යන්ත්‍ර අලුත්වැඩියා කර ඉදිරි වැඩ කිරීමට අවශ්‍ය කටයුතු අප විසින් ඉටු කරමින් පවති. | ව්‍යාපෘතිය කඩිනමින් නැවත ආරම්භ කර වත්කම් ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ)පැලියගොඩ රබර් භාණ්ඩ සංවර්ධන හා සේවා මධ්‍යස්ථානයේ රබර් ආශ්‍රිත යන්ත්‍රෝපකරණ 64 ක් පැවති අතර ඉන් යන්ත්‍ර 26 ක් වර්ෂ 1 ත් වර්ෂ 37ත් අතර කාල පරාසයක සිට අක්‍රියව පැවති අතර රු.85,560ක් වූ Compressor යන්ත්‍රය 2017 වර්ෂයේ සිට භාවිතයකින් තොරව ඇසුරුම් වලම ගබඩාවේ පැවතිණි. තවද, එහි පවතින අමුද්‍රව්‍ය වර්ග 17ක් හා යන්ත්‍ර අමතර කොටස් වර්ග 284 ක් වසර 1 - 17 ත් අතර කාල පරාසයක සිට භාවිතා කිරීමකින් තොරව නිෂ්කාර්යව පැවතිණි. | මෙහි සඳහන් නිෂ්කාර්ය යන්ත්‍ර සූත්‍ර හා එම යන්ත්‍ර වල අමතර කොටස් හා භාවිතා නොකරන අමුද්‍රව්‍ය අංශයෙන් බැහැර කිරීම සඳහා භාණ්ඩ සමීක්ෂණ කමිටුව වෙත යොමු කොට උපදේශක කමිටුවක් පත් කර ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.<br>ඉතා පැරණි දැනට භාවිතා වන කොම්පෙෂර් යන්ත්‍රය අක්‍රීය වන අවස්ථා වලදී අලුත් වැඩියාවට දීර්ඝ කාලයක් ගතවන බැවින් එවකට අංශයේ විසූ ඉංජිනේරු මහතා සහ ප්‍රධාන ඉංජිනේරු අධ්‍යක්ෂකගේ අධීක්ෂණයන් හා අනුමැතිය මත මිලදී ගෙන ඇත. මෙම යන්ත්‍රය අවශ්‍ය අවස්ථා වලදී භාවිතා කරනු ලබන අතර පසුව ඉදිරි ප්‍රයෝජනය සඳහා තබා ඇත . | භාවිතයට නොගත් යන්ත්‍ර භාවිතයට ගැනීම හා අක්‍රීය යන්ත්‍ර ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) 2020 වර්ෂයේ යුනිඩෝ ආයතනය විසින් ඇ. ඩො. 101,130ක් වටිනා යන්ත්‍ර උපකරණ 12 ක් සහ ඇ.ඩො.1167.44 ක් වටිනා භාණ්ඩ මණ්ඩලයට ලබාදී ඒවා ලක්සල ගොඩනැගිල්ලේ ස්ථාපනය කර තාවකාලිකව උණ දැව පුහුණු මධ්‍යස්ථානය ආරම්භ කර තිබුණි. 2022 සැප්තැම්බර් මස මෙම පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ජාතික ශිල්ප සභාවට පැවරීම නිසා එහි තිබූ යන්ත්‍ර උපකරණ ඉවත් කර කටුබැද්ද නවබිම පරිශ්‍රයේ ගොඩනැගිල්ලක අසුරා තිබීමෙන් 2024 ජනවාරි වන විටත් ඒවා භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතිණි. | මෙම උසස් පුහුණු ආයතනය ජාතික ශිල්ප සභාවට පැවරීම නිසා 2023 මැයි මස කටුබැද්ද නවබිම පරිශ්‍රයේ ගොඩනැගිල්ලක එම යන්ත්‍ර සූත්‍ර අසුරා ඇත.මෙම නවබිම පරිශ්‍රයේ නීතිමය අයිතියක් අප ආයතනය වෙත සම්පූර්ණයෙන්ම පැවැරී නොමැති අතර ඒ සඳහා තවම නඩු පවරා තිබීම හේතුවෙන් එහි ඇති ගොඩනැගිල්ල අළුත්වැඩියා කටයුතු සිදු කර යන්ත්‍ර ස්ථාපිත කර සවි කිරීම් ප්‍රමාදයක් ඇති විය.<br>කෙසේ නමුත් ඉදිරි දින කිහිපය තුළදී ඒ සඳහා අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කර යන්ත්‍ර සවිකර පුහුණු වැඩසටහන් පැවැත්වීමට සැලැසුම් කර ඇත. | ව්‍යාපෘතියේ අරමුණු කඩිනමින් ළඟා කර ගැනීමට, වත්කම් ඵලදායීව භාවිතා කිරීමට හා පුහුණු මධ්‍යස්ථානය කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |